සම්බුදුන් වදාළ මහා ශූන්‍යතාව්‍ය

එස්.එම්.ආර්.බී. කපුගෙදර
විශ්‍රාමික අධ්‍යාපන අධ්‍යක්ෂ / අතිරේක අධ්‍යාපන ප්‍රකාශණ

සංසාර ගත සත්තවයා විවිධ මංතල ඔස්සේ සැපය සොයා නොනිමි ගමනක යෙදුනත් අවසානයේ දුකම උරුම කර ගන්නා බවයි, අනාවරණය වන්නේ. මෙම යථාර්ථය සත්‍යදැයි ඔබම සොයා බලන්න. "නිස්‍යයතෙතා නිජ්ජිවො සුඤ්ඤා"..... ආදි වශයෙන් බුදුදහම් පරියායෙහි යථාර්ථය ප්‍රඥාගවේෂිව විමසුමට ලක්කල යුත්තකි. උපදින පවතින හා මියයන සත්තවයෙකු නැති බවයි මෙහි අදහස. සම්මුතියෙහි ඔබේ ඉදුරන් කරා යොමුවන බාහිර සම්මුති ලෝකය පිළිබඳ යථාර්තය පළමු තේරුම්ගත යුත්තකි. සම්මුතිය යනු බාහිරව තුල සම්මන කරගත් මිථ්‍යාවකි. උපතේ සිට මියෙනතුරුම පුද්ගලයා විසින් තමාවෙත පවතිනා ඇස, කන, නාසය, දිව හා කය ඇසුරෙහි ලබාගන්නා විවිධ සංඥාවන් ප්‍රථමයෙන් වර්ණ ශබ්ද ගන්ධ රස හා පහස් ලෙස තමාට ..... මව්පිය වැඩිහිටි ඇසුරෙන් විඥානය පෝෂනය හෙවත් සම්මුතිය සම්මත කරගනී. දෙවනුව අවිධිමත් හා නොවිධිමත් කාරක වෙනුවට විධිමත් අයුරින් තම දැනුම හෙවත් විඥානය ක්‍රමයෙන් සම්මුතිය තුල තහවුරු කර ගැනීම බව අධ්‍යාපනය ලෙස හඳුනාගනී. තත් අධ්‍යාපන ප්‍රවේශය දරුවන්ගේ නිර්මාණශීලි චින්තනය පවා මොට කරමින් ප්‍රාථමික අංශයේදී දැවැන්ත ලෙස විඥාන ශක්තිය මැනීම් තරගයකට දරුවා පමණක් නොව දරුවාගේ මව පවා සෑදි පැහැදි සිටිම ශ්‍රී ලංකාවේ දැකිය හැකිය.

අවාසනාව නම් නිර්මාණයක මූලිකව (Criterion) කරන පරීක්ෂණයක ජීවිතයේ පළමුවරට මුහුන දෙන දරුවන්ගේ අනාගත පෞරුෂ ස්වයංමානය අතළොස්සක් හැර බහුතරයක් බිඳ දමන කුසලතා අනාවරණ කොතරම් අමනෝඥ සහගත ලෙස එම පරීක්ෂණය සියයට 75% .....ක් අසමතුන් ලෙස දෙමව්පිය පමණක් නොව සෙසු පාසල් ප්‍රජාව තුළද හදුනාගැනිමේ ක්‍රියා පිළිවෙත, කොතරම් හාස්‍යජනක ද? මෙම උදහරණය ඔබ වෙත යොමු කළේ ඔබද මෙම සම්මුති විඥාන මායාවකට ගොදුරු වූවකු දැයි සිතිමයටය. සම්මුති විඥානය හුදෙක් මායාවක් බැව් පෙණපිපුණුම පැහැදිලි කරමින්.

පෙණ පිණ්ඩුපමං රූපං
වේදනා බුම්බු ලපමා
සකඤ්ඤා මරිචිකස්ස සංඛාර කදලූපමා
මායුප මංච විඤ්ඤනං
මෙහෙයින් සංසාරගත

ප්‍රජාවා මෙම මායාව තුල සිරවී, සැපම සොයමින් දුක ම අවසානයේ අනපේක්ෂිත ලෙස උරුමකර ගන්නා බැව් දැක්වූහ, කරණීය මෛත්‍රි සූත්‍රය මෙන් වැඩීමට ඉලක්ක කර ගත් සූත්‍ර දහමකි. එහි එන දිට්ඨිවෙ අනුපගම්ම සීලවා දස්සනෙන සස්පන්නො කාමෙසු විනෙය්‍යංගබං නහිජාතු ගබ්භසෙය්‍යං පුනරෙතීති

මෙම ගාථාවේ අන්තර්ගතය නිර්වාණ මාර්ග යයි. සම්මුති දැනුම සියල්ලම සාපේක්ෂ දෘෂ්ඨින්මය. 'සීලවා' යනු කය හෙවත් ශරීරය හා බැඳි පසිරඳුන්ට හේතුඵල වශයෙන් ගලාඑන සංඥා වාරණය කරන තැනැත්තාය "කායෙන වාචාය සංවරො සීලො" එනම් මනස කරා ඉන්ද්‍රිය ඇසුරෙන් ගලා එන වර්ණ ශබ්ද ගන්ධ රසාදි සංඥා හටගැනිම සමඟම නිරෝධවන බැව් දකින තැනැත්තාය. ප්‍රඥාවට අවදි වූ එළඹී සිහියෙන් කටයුතු කරන්නා 'දස්සනෙන සම්පන්නො' හේ දැනුම සම්මුති නොව දැක්ම පරමාර්ථ සත්‍ය දකින්නෙකි. හේ පංචකාම ආස්වාදයේ ආදීනවය ඕපනයිකව ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කරගනී.

නැවත සසරට අනුගත කරන තමා කෙරෙහි පවත්නා ඇස කන දිව නාසය කය හා මනස යන ගැබක නූපදී. නිර්වාණ දහම සාක්ෂාත් කරයි. පරමාර්ථ දහම මෙයයි. එම පුද්ගලයා 'මම' යන සක්කාය දිට්ඨියෙන් මිදිමයි නිවන් මග.

පටිච්ඡ සමුප්පාදයෙන් ද්විත්ව පැතිකඩ වන්නේ සසර දුක කරා යොමු වන අනු සෝතගාමී මාර්ගය හා දුකින් නිදහස් වන පටිසෝතගාමි නිවන් මාර්ගයයි. එහි අනිතර්ගතය හුදෙක් මනෝමූලික සංකල්පය බැව් අවබෝධ කළ යුතුයි. නාම රූප චිත්ත රූප මත සමුදය වන සළායතන ආයතන හය 'මම' ලෙස තහවුරු කර ගැනීමයි සසරට අනුගත වීම.

බුදුහු වචන ගොතන සූත්‍රයේදී "දිට්ඨි ගතංච වුහච්ච අපනීයතා තථාගතං" ලෙස තථාගත දහම මම මගේ සිත කය යන සක්කාය දිට්ඨියෙන් මිදීමයි ලෙස අර්ථකථනය කර ඇත. දිට්ඨි ගතවීම තුල ඔබ සසර දුක හා බැඳේ. කුමක්ද සසර දුක. ජාති ජරා ව්‍යාධි මරණ සෝක පරිදව ලෙස දක්වා ඇත. බුදු දහම දිව්‍ය බ්‍රහ්ම ලෝක හෝ නිරය ඉලක්ක වුවක්ද ? නැත. මෙම සංකල්ප සග්ග නිරය පිළිබඳ දක්වා ඇත්තේ පසු කාලීන බෞද්ධ යතිවරයාණන් වහන් සේලා විසිනි. කාලීනව පිරිහෙමින් පැවති බුදු සසුන පවත්වා ගැනිමට පින් හෙවත් යහපත් කටයුතු වල නිරත කිරීමටත් පාප හෙවත් අයහපත් දේවලින් මුදා ගැනිමටය. ඒ නිසාම සාසන ඉතිහාසයේ බැමිණිතියා සාය / මහසෙන් රජුගේ ශාසන විනාශය / ශ්‍රී රාජසිංහ රජු පීතෘඝාතන පවින් මිදිමට අරිට්ඨකී වෙන්ඩු නම් හිඳු පූජකයාට රු වටී බෞද්ධ පොතපත විනාශය වැනි ව්‍යසන තුල බෞද්ධ පොත පත ධර්ම ග්‍රන්ථ විනාශ විය. ඒ අතර දහම සම්මුති ලෙස හෝ පවත්වා ගැනිම් වස් කුසල අකුසල යථාර්ත වෙනුවට පින් පව් අන්තර්ගත බුදු දහම උපාකාරී විය. මේ අතර 5 සියවසේ ඉන්දියා වේ කාවේරි පටුනේ සිට ශ්‍රී ලංකාවට පැමිණි පතාංජලී නම් පූජක ප්‍රධාන ගෝලයකු වූ බුද්ධ හෝ හිමිදි හෙළටුවා අක්ෂමත පාදකව පාලියට නඟා තැබීමත් ත්‍රිපිටක ධර්මය ග්‍රාම 57 ලෙස පවත්වා ගැනීමට උපකාරී විය. නමුත් බුද්ධඝෝෂ හිමිගේ විසුද්ධි මාර්ගය (58) නිවන් මග සේ එදා මෙදතුර හඳුනා ගනු ලැබුවත් නිවන් මග වසා ඇත්තේ ද එම පරිවර්ථන හා තත් ග්‍රන්ථය තුළින්ම බැව් බව නොදත් කරුණක් විය හැක.

පුඤ්ඤාබි සංඛාර අපුඤ්ඤාබි සංඛාර ලෙස පින් පව් කරන ඔබ සසරටම අනුගතව ජාති ජරා ව්‍යාධි මරණාදී දුක්ඛය කරාම සපැමිණෙන බැව් හදුනාගන්න. මෙසේ වන්නේ ඔබ කාලයේ නිරන්තර ගමනට හසුවී ඇති බැවිනි. සත්වයෙකු ලෙස උපතලන ඔබ ජරා එනම් වයසට යාමේ ධර්මතාවයෙන් මිදී ඇතිද ? ව්‍යාධි ලෙස රෝගවලින් අවසානයේ ස්ථිරවම මරණයට පත්වීම වැළැක්විය හැකිද ? සත්‍ය මෙයම බව බැව් ඔබ වටහාගන්න. උපත සමඟ පාසැල් වියට එළඹීම සමඟ ඔබ උගෙනිම, රැකියා විවාහය දරුවන් තැනීම ගේ දෙර යාන වාහන ඉඩකඩම් සියල්ල සැපම සොයා යන ගමනකි. ඔබට සැපම උරුම වේද ? අවිද්‍යා හෙවත් අනවබෝධය මත, ස්වභාව හේතු පටිච්ඡ ප්‍රත්‍ය වීමෙන් හටගනු ලබන සංඥා එතැනට නිරෝධ වුවත් ඔබ දකිනුයේ පැවතීමයි. මෙහි ප්‍රතිඵලය කුමක්ද ? අනුගෝතගාමී ලෙස පටිච්ඡ සමුප්පාදන දහමට අනුගත වීමයි. මෙය පුන්‍ය පාදකව උපදින පටිච්ච සමුපදය දහමේ සමුදය නම් පැතිකඩයි. එය අවසානයේ දුක කරා සම්ප්‍රාප්තියයි. ඔබේ අරමුණ සසර දුකින් නිදහස් වීම නම්, කළ යුත්තේ කල්‍යාණ මිත්‍රයා මුණ ගැසීමයි. සතර සෝවාන් මග පුප්ඵ ධර්මට නම් කල්‍යාණ මිත්‍රතාවයයි.

කල්‍යාණ මිත්‍රයා දුක ප්‍රත්‍යක්ෂයෙන් දැනගත් අවබෝධ කරගත් දුකෙහි සමුදය හෙවත් හට ගැනීම, දුකෙහි නිරෝධය හා දුක් නිරෝධගාමිණි පටිපදාව ප්‍රත්‍යක්ෂයෙන් දැනගත්, අවබෝධ කරගත් උතුමායි. එබඳු උතුමන් විරල වුවත් වර්තමානයේ බිහි වෙමින් පවතී. ඔබ එබඳු දහම් ප්‍රවේශයකට අනුගත වේ නම් නිවන් මඟ සමීපය.

පටිසෝතගාමී මඟ පධීච්ඡ සමුපාද ධර්මයේ දෙවැනි පැතිකඩයි. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය තුළ ඔබ අසන දහම කුමක්ද ? දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා යයි එනම්, ස්වභාව හේතු මත පසිදුරන් කරා පැමිණෙන වර්ණ ශබ්ද ගන්ධ රස ස්පර්ශාධී සංඥා එම සමුදය හෙවත් හටගැනීම සමඟම නිරෝධ වීමේ ස්වභාව සංසිද්ධිය ප්‍රාඥවෙන් දැකිමකි. එසේ එහි පස්සිකව ඕපනයික දහම ප්‍රත්‍යක්ෂවීම විඥානය නිරෝධයයි. විඥඥානය නොමැති මළමිනියක් පිළිබඳ සිතන්න. ඒ මළමිනිය නම, ආයතන සළායතන පිළිබඳ දනිද ? සියල්ල මේ පටිසෝතගාමී දහම තුළ අවසන්වන අයුරු ප්‍රඥවෙන් මොහොතක් පාසා දැකීම මාර්ග සහනයකි. ඔබ සුදු රෙදි වෙන් වශයෙන් ඇඳුම මාරුකිරීම, වනගත වීම, හුදෙකලා වීම නොවන අතරක් නැතිව ඔබ අවධි වූ මොහොතේ සිට නින්දට යනතුරු සියළුම කාර්ය හා බැඳී ඇති එකම ධර්මතාව ඇති වීම සමඟ එය නැතිවීම නැතහොත් වෙනස් වීම බැව් නුවණින් දැක දැක සියළුම කටයුතු කරන්න. බුදු දහමේ තේමාව මෙයයි. සති සම්ප්‍රදය හෙවත් එළඹී සිහිය පවත්වා ගැනීමයි.

සියළු බුද්ධ අනුශාසනාව ඔබ නිතර සජ්ජායනා කරනු ලබයි. සබ්බ පාපස්ස අකරණං මෙනයින් විග්‍රහ කරන්නේ සියළු පව් නොකිරීමද ? බුදු මග අනුගමනය කරන්නා බුද්ධිමාර්ගයකයි ගමන් කරනුයේ, එබදු පුද්ගලයෙකුට පව් නොකරන්නා කියා බුදුවරුන් අනුශාසනා කිරීම අවශ්‍යද ? ප්‍රඥාපාදකව ගවේෂණ කරන්න. මෙනයින් අවවාදය වූයේ "චේතනාහං භික්ඛවේ කම්මං සද්ධාය කායෙන වාචාය මනසා මෙසේ සිත කය වචන මගින් සිතිවිලි ඉපදවීමම කර්මය බවයි. කර්ම වලට අනුගතවීම සුගතියෙන් දුගතිගාමීව අවසානයේ ජාති ජරා ව්‍යාධි මරණ යන දුකම ඔබ උරුමකර ගැනිමයි. එසේ නම් උක්ත අනුශාසනාව වූයේ ඉන්ද්‍රිය ඇසුරෙන් හටගන්නා සංඥා විකෘතියට බැඳි නැතහොත් උපාදනය කොට සිතිවිලි අවිද්‍යාව මුලකව සංස්කාර නොකරන ලෙසයි. බුදුහු දම්සක් පැතුම් සූත්‍රයේදී සිදුවූ චිත්ත විපර්යාසය ප්‍රකාශ කළේ, "අකුප්පා මේ චේතා විමුක්තියා " ආදි ලෙයසි. සහමුලින්ම සිතිවිලි සකස් කිරීමෙන් මිදුන බවයි. මේ සඳහා මුළු මහත් බෞද්ධයින් උපසම්පදාවට අනුගත විය යුතුය. එනම් "කුසලස්ස උපසම්ප්‍රදවයි". කුමක්ද මේ කුසලය හෙවත් තමා තුලින් උපසම්පද විය යුතු දක්ෂතාව ? එනම් විකෘතියෙන් යුතුව හේතුඵල දහමක් ලෙස හටගන්නා සංඥා උපාදනය නොකිරීමේ දක්ෂතාවයයි. ප්‍රකෘතිය නම් සමුදය හෙවත් හටගන්නා සංඥා එනම් වරකට එකක් බැගින් මනසට බැඳෙන වර්ණ ශබ්ද ගන්ධ රස හාස්‍ය හා මනෝ සංඥ එතැනම නිරුද්ධ වීමයි. දක්ෂතාව නම් මෙම ධර්මතාවය මනා සිහියෙන් දැක ගැනීමයි. මෙයයි නිර්වාණ මාර්ගය.

"සචිත්ථ පධීයෝදපනං" ලෙස අනුශාසනා කළේ මෙම කුසලතාවය සඳහා අනුගත වීමේ මාර්ග ප්‍රවේශයයි. එනම් යෝනිසෙ ර්මකසිකාරයයි. බහිරව සූත්‍රයේදී බාහිය උපාසකතුමාට බුදුන්ගේ අනුශාසනාව **දිටෙයි දිට්ඨිමතතකං සුගත සුත මතනං බුනෙ බුකලාතයෙහි** මෙයයි. ප්‍රඥ ගවේෂිව ඔබේ විතර්කයට හසු කරන්න. සියළු බුද්ධ අනුශාසනය මෙයයි. අරිට්ඨ පරියේෂණ සූත්‍රයේ (මජ්ජිම නිකාය) සඳහන් අයුරු සිදුහත් බෝසතානන් කලකිරීමෙන් යුතුව අතහැර ගියේ සියළු භාවනා දැහැන් සමාපත්තින් බැව් සඳහන්ය. බුද්ධ ගාථාවේ බෝමැඩ වජ්‍රාසනයේ වැඩහුන් බෝ සථානෝ දැඩි වීර්යයෙන් යුතුව මනා සිහියෙන් චිත්ත සමාදිය දියුණු කොට ප්‍රඥව නැතහොත් සර්වඥඥතා ඥානය උපදවා ගැනීමයි. සම්මා සම්බුද්ධත්වය අගතියෙන් තොරව සිතා බලන්න. අග්‍රඋපස්ථායක ආනන්ද තෙරුන් සම්බුද්ධ පරිනිර්වාණය දක්වාම රහත් ඵලයට පැමිණ නැත. උන්වහන් සේට දුන් අවවාදය කුමක්ද ? **"අයංචෝ ආනනන්ද විහාරෝ තථාගතේන සබ්බ නිමිත්තානං අමනසි කාරං අජාඩතනං සු..... විහරති."** මෙහි අන්තර්ගතව ඇති සියළු නිමිති වනුයේ සළායතන හා බැඳෙන වර්ණ ශබ්ද ගන්ධ රස පහස හා ධර්ම නිමිතිය. මේ නිමිති අමනසිකාර කොට මනසිකාර කළ යුතු දහම නම් අතරක් නොමැතිව ගලාඑන සංඥා මාත්‍රයන්ගේ හටගැනිම හෙවත් සමුදයක් ක්ෂණිකව නැතිවීම හෙවත් නිරෝධය මනා සිහියෙන් දැකිමයි. බුදුන් වදාල කර්මස්ථානය මෙයයි.

ප්‍රථම බුද්ධ උද්‍යානයේදී **"වඤ්චාර ගගං චිත්තං තණ්හානං බස මජ්..... ජොතො "** ලෙස තණ්හාව පූර්ණව ක්ෂය කිරීම තුලින් බුදුන් ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කළේ ගත මෙන්ම සිත සකස් නොවන බවයි. අවිද්‍යාවෙන් සැකසෙන කැණිමඬල සිතනාගී නමැති සක්කාය දිට්ඨියයි. මෙය කඩා සුනු විසුනු කළ බැව් නැවත තණ්හාව නමැති වඩුවාට මම නමැති ගෙය සකස් කළ නොහැකි බැව් තමා තුළින් දුටහ.

සිත නමැති මනෝභාවය සමුදය හා නිරෝධ වීමේ න්‍යය පැහැදිලි කලේ... **ඉමස්මිං සති ඉධංහෝති, ඉමස්මිං උප්පාදා ..... ඉමස්මිං අසති ඉමස්මිං .....**
මේ අයුරිනි.

සංඥාවක් ඇතැයි උපාදනය කළ විට විඥඥානය උපදී
සංඥාවක් නැතැයි අවබෝධ කළ විට විඥඥානය නිරෝධ ..... මෙය පටිච්ච සමුප්පාදයේ ද්විත්ව පැතිකඩයි.

රෝහිතස්ස සූත්‍රයේදි ගමනෙන නප නනං ලොතසනනං කුදාචනං ඉමසාමිං යෙව හ්‍යාම මතෙත කළ භාර සසර සහරණ ලොකංච ලොකසමුදයංච ලොක නිරොධංච ලෝක නිරෝධය ගාමිණි පටිපදායම පඤ්ඤජම්

මළ මිනිසක සමඟ සසදන විට කිසිදු සංඥාවක් නොමැති මේ සිරුර හුදෙක් සංඥා ජාලයකැයි පැහැදිලි කළහ. එසේ හැදින්වූයේ සංඥාවක් භව වූ ක්ෂණය තුලම වද වන "භවය" ධර්මතාවයයි.

ලෝක සම්මතය තුල සම්මුති ලෝකය තුල හුදෙක් සංකල්පනික සිතිවිල්ලක් ලෙස දකින ලෙස වදාලහ. මහ සඤ්ඤක සූත්‍රයේදී මොඝරාජට

"සුඤ්ඤකො ලොකං අවෙක්ඛනතං
මොඝරාජ සදා සංතො
සත්තාන දිට්ටිං වුහසි එවං මච්චු කරෝසි යෝ

වක්කලී සූත්‍රයේදී, බුදු සිරුර බුදු පිළිමය තුලින් බුදුන් දැකිය නොහැකි බවත්, යමෙක් දහම දකීද හේ බුදුන් හෙවත් අවබෝධයට පත් වේ යන්න.

යො පටිච්ච සමුප්පාදං පස්සති
සො ධම්මං පස්සති
යෝ ධම්මං පස්සති සෝ මං පස්සති ලෙස බුදුහු වදාලහ. එසේනම් නිවන පසක් කිරීම මතු මෙතේ බුදුන් දවසට පෙර මේ මොහොතේ යථාර්තය සාක්ෂාත් කළ යුතුය.